# අංගරචනා කිරීම

- අතීතයේ දී වෙස් මුහුණු භාවිතය නාට්‍ය ඉදිරිපත් කිරීමේ දී වැඩි වශයෙන් යොදා ගත් බැවින් අංගරචනයට ප්‍රධාන තැනක් නොලැබුණ ද වර්තමානයේ දේශීය නාට්‍ය කලාව තුළ මෙන් ම ලොකයේ ද ඉතා දියුණු අංගරචනා ක්‍රම යොදා ගනියි.
- අංගරචනයේ දී ශෛලිය පිළිබඳ සැලකිලිමත් විය යුතුය. කවර සම්ප්‍රදායේ නාට්‍යයකට වුව ද අංගරචනය යොදා ගනී. ආලෝකකරණයේ දී මුහුණේ හි හැඩතල ත්‍රිමාණ කර පෙන්වීමට අංගරචනය අවශ්‍යවීම එයට හේතුවයි.
- එමෙන් ම අංගරචනයක් සිදු කිරීමට පෙර පිටපත හොඳින් අධ්‍යයනය කළ යුතුය. එහි කාලය, යුගය, දේශය, සංස්කෘතික පසුබිම ආදී සියලු කාරණා අධ්‍යයනය කිරීමෙන් පසුව අංගරචනය කල යුතුය.
- විවිධ චරිත අනුව කළ යුතු අංග රචනා වෙනස් වේ. අංගරචනය සිදු කරන ප්‍රධාන ක්‍රම දෙකෙන් එකක් ශෛලිය හා චරිත ස්වභාවය අනුව යොදාගනිමින් අංගරචනා කළ යුතුය.

  එනම්, 1. සරල අංගරචනය

  2. චරිතාංග අංගරචනය අනුව යි.


යම් පුද්ගලයෙකු ගේ බාහිර ස්වරූපය ඒ ආකාරයෙන් ම ඉදිරිපත් කරන අවස්ථාවක දී සරල අංගරචනය යොදා ගනී. එනම් චරිතයේ සැබෑ වයස, පෙනුම ඒ ආකාරයෙන් ම චරිතය සඳහා යොදා ගන්නා විටදී ය. බොහෝ විට තරුණියන් සුන්දරත්වය උදෙසා ද සරල අංගරචනයේ යෙදෙති. බොහෝ විට ලෝකධර්මී නාට්‍ය සඳහා යොදා ගන්නේ සරල අංගරචනය යි. නමුත් රංගන ශිල්පියෙකු හෝ ශිල්පිනියක හාත්පසින් ම වෙනස් චරිතයක් නිරූපණය කිරීමේ දී එම චරිතයට අනුකූලවන ආකාරයෙන් නිර්මාණාත්මකව ඔහු හෝ ඇය වෙස් ගැන්වීම චරිතාංග අංගරචනයේ දී සිදු කරයි.


සරල අංගරචනය සිදු කළ අවස්ථා





චරිතාංග අංගරචනා සිදු කළ අවස්ථා










- අංගරචනා කිරීමේ දී අඳුර හා එළිය යන මූලධර්මය යොදා ගනී. විශේෂයෙන් වර්ණ භාවිත කර මුහුණේ ත්‍රිමාණ ලක්ෂණ මතුකොට පෙන්වීම සඳහා මෙම මූලධර්මය ඉතා වැදගත් වේ. අංගරචනයේ දී මුහුණ බෙදෙනා ප්‍රධාන කොටස් වලට මෙම මූලධර්මය යොදා ගනිමින් අවශ්‍ය ලෙස චරිතයේ ස්වරූපය මතු කර ගත හැක. එනම් එම අංග හරහා වයසක බව, තරුණ බව, මානසික ව්‍යාකූලතාව, බුද්ධිමත් බව, කල්පනාකාරී බව, රාගය, සුන්දරත්වය ආදී තත්ත්වයන් ඉස්මතු කර ගත හැක.




මෙහි දී මුහුණේ ගිල්වා පෙන්විය යුතු කොටස් අඳුරු හෙවත් සුදීප්ත කරන අතර ඉස්මතු කර පෙන්විය යුතු කොටස් එළිය හෙවත් දීප්ත කරයි. අඳුරු කිරීමෙන් කෙට්ටු බව, වයස බව ඉසමතු කළ හැකි අතර දීප්තිමත් කර පෙන්වීමෙන් සුන්දරත්වය, තාරුණ්‍යය, පිරිපුන් බව ඉස්මතු කළ හැක.





- අංගරචනය කිරීමේ දී ආලෝකකරණය හා බැඳි න්‍යායන් දැන සිටීම ද වැදගත් ය. එනම් සුදු පැහැය ආලෝකය පරාවර්තනය කරන බව, කළු පැහැය ආලෝකය උරා ගන්නා බව, ඇතැම් ආලෝකයන් වස්තුව අනුව උරා ගත හැකි බව හෝ පරාවර්තනය විය හැකි බව, පරාවර්තන වර්ණ මඟින් වස්තුවේ වර්ණය වෙනස් විය හැකි බව යනාදිය යි.
- චරිතය ජීවත්වන කාලය, දේශය, යුගය, සාමාජීක, ආර්ථීක, ආගමික හා අධ්‍යාපනික තත්ත්වයන් පිළිබඳ ව මනා අවබෝධයකින් අංග රචනය කළ යුතු වේ.
- චරිතවල බාහිර ස්වරූපයන් පමණක් නොව අභ්‍යන්තර චරිත ලක්ෂණ නිරූපණය කිරීම සඳහා ද අංගරචනය බලපායි. එමෙන් ම පිටපතට අනුව සත්ත්ව චරිත නිරූපණය කිරීමට ඇති

අවස්ථාවල දී සුදුසු පරිදි චරිතාංග අංගරචනය මඟින් නිර්මාණාත්මක අංගරචනයේ යෙදීමට අංගරචනා ශිල්පියාට සිදු වේ.

උදාහරණ,

- නරි බෑණා නාට්‍යයේ නරියා ගේ චරිතය
- සිංහබාහු නාට්‍යයේ සිංහයා ගේ චරිතය



- චරිත නිරූපණය කරන පුද්ගලයා ගේ සමේ වර්ණය, මුහුණේ හැඩය, අංගරචනය සඳහා බලපායි.
- ප්‍රේක්ෂකයාට චරිත හඳුනා ගැනීමට, චරිත පිළිබඳ නළුවා තුළත් ප්‍රේක්ෂකයා තුළත් විශ්වසනීයත්වයක් ගොඩනඟා ගැනීමට හැකිවීම, නළුවා හට සමාරෝපය සඳහා උපකාරී වීම, ආලෝකකරණ තත්ත්වයන් යටතේ යටපත් විය හැකි මුහුණේ හැඩතල, ඉරියව් හා ත්‍රිමාණ ලක්ෂණ මතුකර දැක්වීම ආදිය සඳහා අංගරචනය ඉවහල් වේ.

පැවරුම

1 අංග රචනය යනු කුමක්ද?

2 අංගරචනය සිදුවන  ප්‍රධාන ක්‍රම දෙක නම් කරන්න.

3 “චරිත නිරූපනය කරන පුද්ගලයාගේ සමේ වර්ණය හා හැඩය අංග රචනය සඳහා බලපායි” යන්න පහදන්න.